# 10 පරිසර මිතුරෝ




නිලන්ත,

අර අලවලා තියෙන

ලොකු පෝස්ටරය මොකක් ද?

යමු, ළඟට ගිහින් කියවලා බලමු.

# ඩෙංගු උවදුර දුරලමු

- මේ දිනවල පවතින වර්ෂාව නිසා ඩෙංගු රෝගය ශීඝ්‍රයෙන් පැතිරෙයි.
- ඩෙංගු මාරාන්තික රෝගයකි. එය ඔබට මරු කැඳවයි.

## ඩෙංගු මර්දනය කිරීම සඳහා ඔබත් එක් වන්න



### ඔබ කළ යුතු දේ

- ඔබේ නිවෙස අවට පරිසරය පිරිසිදුව තබා ගන්න.
- දිනපතා එකතු වන ප්ලාස්ටික්, පොලිතීන් වැනි දෑ තැන් තැන්වල නොදමන්න.
- වෙනත් ඉවත ලන ද්‍රව්‍ය ගෙවත්තේ නොදමා භාජනවලට එකතු කරන්න.
- නිවෙසේ වැහි පීලි හා විසිතුරු පැළෑටි තුළ වතුර රැඳී තිබේ දැයි නිතර පරීක්ෂා කරන්න.
- ගෙවත්ත පිරිසිදු කර කුණු රොඩු පුලුස්සා දමන්න.
- මදුරුවන් බෝ වන තැන් විනාශ කර දමන්න.

ඉහත උපදෙස් අනුව නිවෙසේ හා පරිසරයේ පිරිසිදුකම රැක ගෙන ඩෙංගු උවදුර දුරලමු.

**පරිසරය පිරිසිදුව තබා ගනිමු. නිරෝගී බව සුරකිමු.**

(පරිසර මිතුරෝ සංවිධානයේ පණිවිඩයකි.)



නිලන්ත, අපි නම් හැම සෙනසුරාදා ඉරිදා ම

ගෙවත්ත පිරිසිදු කරනවා.

මම අද ම තාත්තාට කියන්න ඕනෑ

වැහිපීලි පිරිසිදු කරන්න කියලා.

පෝස්ටරේ තියෙන විදිහට අපි ඔක්කොම වැඩ කළොත්

ඩෙංගු මර්දනය කරන එක හරි ම පහසු යි.

පරිසර දිනය ගැන ටීචර් කිව්ව නේද?

අපි මේ ගැන හෙට ටීචර්ට කියමු.

ටීචර්, අපි ඊයේ පෝස්ටරයක් දැක්කා.

හොඳයි, ඒකේ මොනවා ද තිබුණේ?

**ඩෙංගු මර්දනය කරන්න**

පරිසරය පිරිසිදු කරන හැටි ඒකේ තිබුණා.

අපි ඊයේ හවස ම අපේ ගෙදර වටේට පිරිසිදු කළා.

එහෙනම්, අපිත් පරිසර දිනයට පාසල් වත්තේ

**ශ්‍රමදානයක්** කරමු.

හා... ටීචර් අපි කැමැතියි.

අපි අම්මලා තාත්තලාත් එක්ක එන්නම්.

## වචන මාලාව

ඩෙංගු - டெங்கு

ශීඝ්‍රයෙන් - வேகமாக

පැතිරෙයි - பரவுகிறது

පරිසරය - சூழல்

දිනපතා - தினந்தோறும்

ඉවත ලන ද්‍රව්‍ය - கழிவுப்பொருட்கள்

වැහි පීලි - மழை நீர் குழாய்

වතුර - நீர்

පුලුස්සා දමන්න - தீ வையுங்கள்

ඩෙංගු මර්දනය - டெங்கு ஒழிப்பு

ශ්‍රමදානයක් - சிரமதானம்

## ක්‍රියාකාරකම 01

යා කරමු. කියවමු.
இணைப்போம்

| | |
|---|---|
| 1. ඔබේ පරිසරය පිරිසිදුව | නොදමන්න |
| 2. ඩෙංගු පැතිරී යෑම | සෝදිසි කරන්න |
| 3. දිනපතා ගෙවත්ත | විනාශ කරන්න |
| 4. කුණු කසළ තැන් තැන්වල | තබා ගන්න |
| 5. මදුරුවන් බෝ වන තැන් | වළක්වන්න |

## ක්‍රියාකාරකම 02

නිවැරදි අකුර තෝරා ලියමු. කියවමු.
சரியான எழுத்தை தெரிவு செய்து எழுதுவோம், வாசிப்போம்.

1. මොක ___ ද? (ත්,ක්)
2. මර් ___ නය (ත,ද)
3. වර් ___ ව (ෂා,චා)
4. ඉවත ලන ___ වය (ද්‍ර,ම)
5. මදු ___ වන් (රු,රැ)


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## ක්‍රියාකාරකම 03

**පිළිතුර තෝරමු. කියවමු. ලියමු.**
**விடையை தெரிவு செய்வோம், வாசிப்போம், எழுதுவோம்.**

1. මෙහි සඳහන් රෝගය කුමක් ද? **(ඩෙංගු/බරවා)**
2. ඩෙංගු පතුරවන්නේ කවුරුද? **(මැස්සා/මදුරුවා)**
3. ඩෙංගු මදුරුවා බෝ වන්නේ කොහේ ද? **(වතුරේ/ගසේ)**
4. පණිවිඩය ලබා දෙන්නේ කවුරුද? **(විදුහල්පතිතුමා/ පරිසර මිතුරෝ)**
5. ශ්‍රමදානයක් කරන්නේ කවදා ද? **(වැඩිහිටි දිනයේ/ පරිසර දිනයේ)**

## ක්‍රියාකාරකම 04

**පිළිතුර තෝරමු. කියවමු. ලියමු.**
**விடையை தெரிவுசெய்வோம், வாசிப்போம், எழுதுவோம்.**

1. මේ දිනවල .............................. ඩෙංගු රෝගය පැතිරෙයි.
   (තදින්, ශීඝ්‍රයෙන්, හෙමිහිට)

2. ඩෙංගු ................................ බෝ වන තැන් විනාශ කරන්න ඕනෑ. (මදුරුවන්, රෝගීන්, පරිසරය)

3. නිතර ම ඔබ අවට ............................................ පිරිසිදුව තබා ගන්න. (පරිසරය, නිවෙස, අහස)

4. ඉවත ලන ද්‍රව්‍ය ගෙවත්තේ නොදමා ................................. දමන්න. (වළකට, ගඟකට, භාජනවලට)

5. වතුර රැඳී තිබේ දැයි දිනපතා .......................... බලන්න. (සොයා, සිතා, අසා)

## ක්‍රියාකාරකම 05

**ඔබත් ඩෙංගු මර්දනය පිළිබඳව වර්ණවත් පෝස්ටරයක් සකස් කර, පාසලේ දැන්වීම් පුවරුවේ අලවන්න.**

**டெங்கு ஒழிப்பு சம்பந்தமான சுவரொட்டி ஒன்றைத் தயாரித்து, பாடசாலை அறிவித்தல் பலகையில் ஒட்டுங்கள்.**